**ජා-ඇල ප්‍රාදේශීය සභාව - 2021**

**-----------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**--------------**

### 1.1 තත්ත්වාගණනය කළ මතය

**---------------------------**

ජා-ඇල ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට ජා-ඇල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-----------------------------------------------

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතියට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

**-------------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශකිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදකවූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව්කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(I)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(I)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මුල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගිණුම්කරණ ප්‍රතිපත්ති අංක 3.5 යටතේ ස්ථාවර වත්කම් සරල මාර්ග ක්‍රමය යටතේ ක්ෂය කිරීම සිදු කරන බව දක්වා තිබුණද, ස්ථාවර වත්කම් සඳහා ක්ෂය වෙන් කිරීමේ ගිණුමක් නොපවත්වා ස්ථාවර වත්කම් ගිණුම තුළ ක්ෂය ගැලපීම් සිදු කර තිබීමෙන් වත්කම් පිරිවැයට නොව ශුද්ධ අගයට ගිණුම තුළ පෙන්වා තිබුණි. | 2022 අවසන් ගිණුම පිළියෙල කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. | **මුල්‍ය ප්‍රකාශන මඟින් හෙළිදරව් කර තිබූ ප්‍රතිපත්ති අනුව** කටයුතු කළ යුතුවේ. |

### 1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගෙවිය යුතු වාහන කුළී රු.952,060 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | 2022 අවසන් ගිණුම් පිළියෙල කිරීමේදී ජ'නල් අංක 01 යටතේ නිවැරදි කර ඇති බව දන්වමි. | නිවැරදිව ගිණුම්ගත කළයුතු වේ. |
| (ආ) | සමාලෝචිත වර්ෂය සඳහා වූ ලැබිය යුතු හා ලැබූ ප්‍රාග්ධන ප්‍රදාන රු.106,758,461 කින් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | 2022 වර්ෂයේ අවසන් ගිණුම පිළියෙල කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. |
| (ඇ) | ඉකුත් වර්ෂය සඳහා වූ ප්‍රාග්ධන ප්‍රදාන, සමාලෝචිත වර්ෂයේදී රු.4,452,469 කින් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | | |
| (ඈ) | සමාලෝචිත වර්ෂය සඳහා සටහන් අංක 5 යටතේ පුනරාවර්තන නොවන වියදම් සඳහා රජයෙන් කළ මාරු කිරීම් රු.4,356,539 ක් ලෙස සඳහන් වුවද විස්තීර්ණ ආදායම් ප්‍රකාශයට එම මුදල ඇතුලත් කර නොතිබීමෙන් ආදායම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | | |
| (ඉ) | විමධ්‍යගත අයවැය ක්‍රියාත්මක වැඩසටහන යටතේ රු.184,877 කින් ණයහිමියෝ හා ණයගැතියෝ වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | | |
| (ඊ) | පරිත්‍යාග ලෙස ලැබූ රු.248,000 ක් වූ ආයුර්වේද බෙහෙත් තොග ලැබීමක් ප්‍රාග්ධන ලැබීම් යටතේ ගිණුම්ගත කර තිබුණි. | | |

| | | |
|---|---|---|
| (උ) | ගිවිසුම්ගත වීමක් හෝ සිදු කර නොතිබූ රු.6,800,000 ක් වූ ව්‍යාපෘති 7 ක් සඳහා ණයහිමි හා ණයගැති වෙන්කිරීම් කර තිබීමෙන් එම ප්‍රමාණයෙන් එම ගිණුම් වැඩියෙන් දක්වා තිබුණි. | ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන නොලැබෙන බව දැනගන්නට ලැබුණේ අවසන් කාල සීමාවේදී බව දන්වමි. |

### 1.6.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ගිණුම් විෂයයන් 06 ක 2021 දෙසැම්බර් 31 දිනට ගිණුමේ ශේෂය හා උපයෝගී ලේඛන අනුව ශේෂයන් අතර රු.98,891,470 ක වෙනසක් විය. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. | අදාල ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. |

### 1.6.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වසර 10 කට වැඩි කාලයක් ඉක්මවූ ශේෂ 3 කට අදාලව රු.10,779,769 ක් හා වසර 5 ඉක්මවූ ශේෂ 3 කට අදාලව රු.109,471,624 ක් වූ ලැබියයුතු ශේෂ නිරවුල් කර නොතිබුණි. | ගිණුම් උපදේශක ගෙන් ලැබී ඇති වාර්තාව පළාත් පාලන කොමසාරිස් වෙත යවා ඇති බව දන්වමි. | අය කර ගැනීමට කටයුතු කළ යුතුවේ. |
| ( ආ) | වසර 05 කට, වැඩි වටිනාකම රු. 5,149,327 ක් වූ ගෙවිය යුතු ශේෂ 21 ක් ගෙවා නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි | නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. |

### 1.6.5 අවිනිශ්චිත ගිණුම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 1992 වර්ෂයේ සිට පැවත එන රු.236,425 ක අවිනිශ්චිත ගිණුමේ බැර ශේෂය නිරවුල් කිරීම සඳහා පත් කර තිබූ ගිණුම් උපදේශකගේ වාර්තාවට අනුව නීති රීතිවලට එකඟව සමුච්චිත අරමුදලට ගලපා ශේෂය ඉවත් කර ගැනීමට නිර්දේශ කර තිබූ අතර එය පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර තිබුණද මෙතෙක් නිරවුල් කර නොතිබුණි. | ගිණුම් උපදේශක ගෙන් ලැබී ඇති වාර්තාව පළාත් පාලන කොමසාරිස් වෙත යවා ඇති බව දන්වමි. | නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ |

### 1.6.6 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| හඳුනානොගත් විවිධ තැන්පත් රු.135,746,660 ක ශේෂයක්ද රු.53,678,225 ක් වූ තැන්පත් වර්ග 6 කට අදාළ ශේෂයන්ද රු.221,848,091 ක් වටිනා ජංගම වත්කම් අයිතම 4 ක් හා රු.106,451,654 ක් වූ ජංගම වගකීම් අයිතම 2 ක් සනාථ කර ගැන්ම සඳහා ප්‍රමාණවත් පරිදි ලේඛන, උපලේඛන හා විස්තරාත්මක කාල විශ්ලේෂණ ඉදිරිපත් කර නොතිබුණි. | උපලේඛන කඩිනමින් සකස්කර හා පැරණි ශේෂයන් සොයා බලා ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බවත් දන්වමි. | ගිණුම් ශේෂ තහවුරු කරන තොරතුරු ඉදිරිපත් කළ යුතුවේ. |

## 1.7 අනුකූල නොවීම්

**නීතිරීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීතිරීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි අංක 762 | තොග මට්ටම් පවත්වා ගැනීම හා නැවත ඇනවුම් මට්ටම් තීරණය කිරීම ගබඩා නිලධාරියාගේ රාජකාරිය වුවද එම මට්ටම් පවත්වා නොගැනීම නිසා වටිනාකම රු.828,576 ක් වූ තාර බැරල් 40 ක හදිසි මිලදී ගැනීමක් සිදු කර තිබුණි. | ගබඩාවේ සෑම භාණ්ඩයකම හා ද්‍රව්‍යකම උපරිම අවම මට්ටම් සකස් කර ගබඩා නිලධාරියට භාර දීමට කමිටුවක් පත්කර කටයුතු කිරීමට ක්‍රියා කරන බව දන්වමි. | යොමුගත රෙගුලාසියට අනුව කටයුතු කළ යුතුවේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

---

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

---

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ අතිරික්තය රු.40,748,205 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තයරු. 70,783,624 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

---

#### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

---

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය ආරම්භයට තිබූ කුලී හිඟය තුළ, කඩ කුලී හා බදුකර කුලී හිඟ පිළිවෙලින් රු7.191,817 ක් හා රු. 9,196,226 ක් වුවද සමාලෝචිත වර්ෂයට හිඟයෙන් අය කර තිබුණේ පිළිවෙලින් රු.2,156,751 ක් හා රු.100,918 ක් වන හෙයින් හිඟ අය කිරීම දුර්වල තත්ත්වයක පැවතිණි. | කොවිඩ් වසංගත තත්වය හේතුවෙන් මස්කඩ හා සතිපොල පවත්වාගෙන ගිය ටෙන්ඩර්කරුවන් විසින් කොවිඩ් සහන ලබා ගැනීමට ඉල්ලීම් කරන ලදි.එසේ වුවද කොවිඩ් සංවරණ සීමා ඉවත් කිරීමෙන් පසුව උපරිම අයුරින් අදාල කඩකුලී මුදල් අයකර දී ඇති බවද දන්වමි. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ |
| (ආ) | රාගම පොදු වෙළඳපලෙහි කඩ කාමර 08 ක බදු ගිවිස ගත් පුද්ගලයින් නොව වෙනත් පුද්ගලයින් විසින් දීර්ඝ කාලයක සිට ව්‍යාපාර කටයුතු සිදුකරන අතර බස්නාහිර පළාත් පාලන කොමසාරිස්ගේ 2020 දෙසැම්බර් 03 දිනැති අංක LGD/13/2016 (I) දරන චක්‍රලේඛයේ දැක්වෙන පරිදි අදාල දේපළ සම්බන්ධයෙන් වන තක්සේරු කරන ලද මාසික කුලිය මෙන් හැට ගුණයක සමාන මුදලක් පැවරුම් සඳහා වන ගාස්තුවක් වශයෙන් අයකොට දේපළෙහි භුක්තිය දැනට ව්‍යාපාර කටයුතු සිදුකරන පුද්ගලයන් වෙත පවරා දීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛයට අනුකූලව නවබදු ගිවිසුමක් කෙටුම්පත් කිරීම සඳහා කමිටුවක් පත්කර ඇති අතර එම කමිටුව මගින් නව ගිවිසුමක් කෙටුම්පත් කර මහා සභාව වෙත ඉදිරිපත් කිරීමට නියමිතය.ඒ අනුව ඉදිරි කටයුතු සිදු කිරිමට නියමිත බව දන්වමි. | හිඟ අය කර ගැනීමට කටයුතු කළ යුතු අතර පැවරුම් සඳහා චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | රාගම සතිපොළ 2021 වර්ෂය සඳහා බදු දීමේදී බදු ගිවිසුමේ 3 වන වගන්තියට අනුව මාස 9 ක බදු මුදල වන රු.845,370 සඳහා පිළිගත හැකි දේපළ ඇපයක් හෝ බැංකු අණකරයක් තැබියයුතු අතර මෙම වටිනාකමට සමාන දේපළක් ඇටෝනි බලපත්‍රයක් මගින් සභාව වෙත පැවරීමට එකඟවී තිබුණි. නමුත් 2022 ජනවාරි 06 දින වන විටත් මෙම ඇටෝනි බලපත්‍රය ලියාපදිංචි කර නොතිබුණු අතර මෙම දේපළ ඇපය සභාව වෙත පවරා ගැනීමටද කටයුතු කර නොතිබුණි. මෙම බදුකරු විසින් 2021වර්ෂය සඳහා හිඟ බදු මුදල් රු.318,058 ක් 2022 ජනවාරි 06 දින වන විටත් ගෙවීමට තිබුණි. | කොවිඩ් වසංගත තත්වය මත බදු සහන ඉල්ලා සිටින අතර දේපල ඇපය ලියාපදිංචි කර ලබාදීම සිදුකර නොමැති බව කාරුණිකව දන්වමි. | ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබවිහරණය පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටුකිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රාදේශීය සභාව විසින් සභාවේ මෙහෙයුම් කටයුතු සම්බන්ධව කඳාන මහජන බැංකුවේ පවත්වා ගෙන යනු ලබන ජංගම ගිණුමේ සෑම මසකම රු.මිලියන 146 ක් හා රු.මිලියන 190 ක පරාසයක් තුළ පිහිටන මුදල් ශේෂයක් නිරතුරුවම පවත්වා ගෙන යනු ලබන අතර එම මුදල් ආයෝජනය කෙරෙහි සභාව සලකා බලා නොතිබුණි. | අපේක්ෂිත ආදායම් ඉලක්ක වකවානුව තුල දී අයකර ගැනීමට නොහැකිවීම හා හදිසි ආපදා අවස්ථාවලදි මූල්‍ය ප්‍රතිපාදන අවශ්‍ය වන බැවින් ජංගම ගිණුමේ ශේෂය පවත්වාගෙන යාමට සිදු වූ බව දන්වමි. | අතිරික්ත මුදල් ආයෝජනය කිරීමට කටයුතු කළ යුතුවේ. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

-----------------------------

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | --------------------- | ------------- | ------------ |
| (අ) | බිම් කට්ටිකර වෙන්දේසි කරන ලද ජා-ඇල කනුවන අරලිය උද්‍යානය නැමති ඉඩමින් සභාව වෙත පවරණු ලැබූ ලොට් අංක 13 ලෙස නම්කර ඇති රූඩ් 02 පර්චස් 31.62 වන විවෘත භූමිය සඳහා සභාව විසින් අනුමත කරන ලද සැලැස්ම හා කූඨ ලෙස වෙනස් කර තිබූ බිම් සැලැස්මක්ද ඉදිරිපත්ව තිබූ අතර එය පරීක්ෂාවේදී ලොට් අංක 18ට යාබදව තවත් බිම් කොටසක් ලොට් අංක 19 ලෙස අලුතින් එකතු කර දෙමහල් නිවසක් ඉදිකර තිබූ බවත් එම නිවස ඉදිරිපිට මාර්ගය තාර දමා තිබූ බවත් නිරීක්ෂණය විය. ඒ අනුව ලොට් අංක 13 දරන ප්‍රදේශය සම්පූර්ණ වශයෙන් අනවසර පදංචියකට නතුවී ඇති බව නිරීක්ෂණය වූ හෙයින් සභාවේ දේපල ආරක්ෂාව හා අනවසර පදිංචිකරුවන් ඉවත් කිරීම සම්බන්ධයෙන් සභාව කටයුතු කර නොතිබුණි. | නීතිමය කටයුතු කිරීමට පැවරුම් ඔප්පුව අවශ්‍ය වන බැවින් එහි ඔප්පුව ලබා ගැනීමට කටයුතු කරමින් පවතී. ඔප්පුව ලබාගත් විගස නීතිමය හිමිකම ලබාගැනීමට කටයුතු කරන බව දන්වමි. | සභා දේපළ ආරක්ෂා කිරීමට හා නිරවුල් භුක්තිය ලබා ගැනීමට කටයුතු කළ යුතුවේ. |
| (ආ) | දඹුව ප්‍රදේශයේ පිහිටි දඹුව නිවාස යෝජනා ක්‍රමය පිහිටි භූමියෙන් අක්කර 05 ක පමණ ඉඩම් ප්‍රමාණයක් පොදු පහසුකම් සඳහා වෙන් කර ඇති අතර 2022 ජනවාරි 07 විගණිත දින වන විටත් සභාව වෙත එය පවරා ගෙන නොතිබුණි. මෙම භූමියේ අනවසර ඉදිකිරීම් සිදුකර ඇති බවත් 2018 සැප්තැම්බර් 10 දින වන විට මෙම අක්කර 5 ක භූමි ප්‍රමාණයෙන් අක්කර 2 ක පමණ භූමි ප්‍රමාණයක් පමණක් ඉතිරිව ඇති බවත් වාර්තා වී තිබූ අතර භූමිය නිසි පරිදි සභාව වෙත පවරා ගැනීමට කටයුතු නොකිරීම මේ සඳහා බලපා තිබුණි. | පිඹුර ලද වහාම පැවරුම් නියෝගයක් නිකුත් කරන බව නිවාස අධිකාරියේ ගම්පහ දිස්ත්‍රික් කාර්යාලයෙන් දැනුම් දී ඇති බව දන්වමි. | සභාව වෙත කඩිනමින් පවරා ගැනීමට කටයුතු කළ යුතුවේ. |

**3.3 වත්කම් කළමනාකරණය**

-------------------------

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | --------------------- | ------------- | ------------ |
| (අ) | ඔප්පුව හා පිඹුර යන දෙකම හෝ ඉන් එකක් නිවැරදිව හඳුනා ගැනීමට හැකි අයුරින් සභාව සතුව තිබියදීත් සොයාගත නොහැකි ඉඩම් ලෙස, | දේපළ නිවැරදිව පොදුවේ හඳුනාගත නොහැකි තත්ත්වයක පවතී. ඒවා හඳුනාගෙන විධිමත්ව | සභාව සතු දේපළ නිරවුල් කර ගැනීමට කටයුතු කළයුතු වේ. |

| | | | |
|---|---|---|---|
| | ඉඩම් 08 ක් සමීක්ෂණ මණ්ඩලය විසින් දක්වා තිබුණි. | වත්මන් ලේඛනයෙන් ඉවත් කිරීමට කටයුතු කරන බව දන්වමි. | |
| (ආ) | සභාව සතු ඉඩම් 06 ක අනවසර නිවාස ඉදිකිරීම් සිදුව ඇති අතර මෙම අනවසර ඉදිකිරීම් සහිත ඉඩම් බොහොමයක්ම වෙන්දේසි ඉඩම් සඳහා ලැබෙන පොදු බිම් කොටස බව නිරීක්ෂණය විය. මෙම ඉඩම්වල අයිතිය සුරක්ෂිත කර ගැනීම සඳහා සභාව විසින් නිසි ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබීම හේතුවෙන් මෙවැනි අනවසර ඉදිකිරීම් සිදුකර ඇති බව නිරීක්ෂණය වූ අතර ඒ හේතුව නිසාම අදාල වෙන්දේසි ඉඩම්වල පදිංචි නිවැසියන්ගේ සුබසාධන කටයුතුවලට හා ආරක්ෂාවට හානිකර බලපෑම් උද්ගතවී තිබුණි. | ක්‍රියාත්මක කළ යුතු ආකාරය පිළිබදව අණ්ඩුකාරවරයාගේ උපදෙස් ලබා ගැනීමට මුදල් කමිටුව තීරණය කර ඇති නිසා, ඒ අනුව කටයුතු කරමින් පවතින බව දන්වමි. | අනවසර ඉදි කිරීම් ඉවත්කර නිරවුල් භුක්තිය ලබා ගත යුතුවේ. |
| (ඇ) | වර්තමාන වටිනාකම රු.1,200,000 ක් වූ ටොන් 8 ක මාර්ග තලනය 2019 මැයි 21 දින සිට නිෂ්ක්‍රීයව පැවතිණි. | මෙම මාර්ග තලනය අපහරණය කිරීමට හෝ කළ යුතු වෙනත් ක්‍රියා මාර්ගයක් පිළිබදව සභාවේ එකගතාවය මත කටයුතු කරන බව දන්වමි | නිසි පරිදි උපයෝජනය කළ යුතුවේ. |

**3.4** වැඩ අවසන් නොවූ ව්‍යාපෘති

-----------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ග්‍රාමීය මාර්ග සංවර්ධන ව්‍යාපෘති 103 ක් සඳහා රු.87,000,000 ක් ප්‍රතිපාදන අනුමත වී ඒ සඳහා ණයගැති හා ණයහිමි ප්‍රතිපාදන වෙන්කර තිබුණි. මෙම ව්‍යාපෘති ඊළග වසරට අවිච්ඡේද නොවන බව දැනුවත් කර තිබූ අතර, ඒ අනුව කිසිදු ව්‍යාපෘතියක වැඩ සමාලෝචිත වර්ෂයේ අවසන් කර නොතිබීම හේතුවෙන් මෙම මුදල් ලැබීමේ අවධානමකටද මුහුණ දීමට සිදුවී තිබුණි. | බොහෝ අවස්ථාවල අවිඡ්ඡේද නොකරන බව දැන්වූවද අඩ වශයෙන් හෝ නිමකළ ව්‍යාපෘති සඳහා බොහෝ අවස්ථාවල අවිච්ඡේද වන නිසා මෙසේ ණයහිමි කිරීමට තීරණය කරන ලද බව දන්වමි. | අවිච්ඡේද නොවන ව්‍යාපෘතිවල වැඩ අවසන් කිරීම සමාලෝචිත වර්ෂය තුළ සිදු කළ යුතුවේ. |

**3.5 ප්‍රසම්පාදනය**

**3.5.1 භාණ්ඩ හා සේවා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (ඇ) පුරනැගුම ගොඩනැගිල්ලේ කාර්යාල කොටස පාටිෂන් කිරීම, විදුලිය හා පරිගණක අන්තර්ජාල පහසුකම් තත්ගත කිරිම, අභ්‍යන්තර දුරකථන පද්ධතිය සකස් කිරීම හා කාර්යාල උපකරණ සැපයීම යන භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදනය වෙනුවෙන් රු.17,775,208 ක් වැය කර තිබුණි. අයිතම 05 ම එකම ආයතනයක් මඟින් ලංසු ඉදිරිපත් කරන ආයතන සඳහා, මිල ගණන් ඇඟයීමේදී ප්‍රමුඛතාවය ලබා දෙන බවට වගන්තියක් ප්‍රසම්පාදන දැන්වීමෙහි ඇතුළත් කිරීමෙන් ප්‍රසම්පාදනය සීමාවීම හේතුවෙන් එක් එක් භාණ්ඩ හා සේවා සැපයිම් සඳහා විශේෂිත වූ සැපයුම් ආයතනවලට ලංසු ඉදිරිපත් කිරිමට පෙළඹීමත් සිදු නොවිය හැකි අතර එය රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2 වගන්තියට පටහැනි විය. ඒ අනුව සියලු සැපයුම් සඳහා ලංසු ඉදිරිපත් කර තිබුණේ එක් ආයතනයක් පමණක් වන අතර එයින් කාර්යාල උපකරණ සඳහා ජාතික වශයෙන් සැපයුම්කරුවන් විශාල පිරිසක් සිටියද මෙම ආයතනයේ ලංසුව සඳහා පමණක් ලංසු ඇගයීම් කර නිර්දේශ ලබා දී තිබුණි. අතිරේක වැඩ සඳහා රු.4,258,160 ක් ගෙවීම් කිරිමේදී මුල් නිර්දේශය සිදුකරන ලද විදුලි ඉංජිනේරුවරයාගේ නිර්දේශ ලබාගෙන නොතිබුණි. | එකම ආයතනයකින් ඉදිරිපත් කිරීමේදී ඒ සඳහා ඇගයීමේදී ප්‍රමුඛතාවය ලබා දෙන බවට වගන්තියක් ප්‍රසම්පාදන දැන්වීමේ සටහන් කලේ මෙම කාර්යයන් වඩාත් විධිමත්ව හා සභාවට වාසිදායක ලෙස ඉටු කර ගැනීමේ අරමුණින් බවද දන්වමි. තවද අතිරේඛව සිදු කළ වැඩ සඳහා පිලිගත් මිළ ගනන් වලට අනුව ගෙවීම් සිදු කර ඇති බවද වැඩිදුරටත් දන්වමි. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුවේ. |

**3.6 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කඳාන වෙළඳපලේ පවතින ඉදිරිපස වැට සකස් කර ගේට්ටුවක් අලුතින් යොදා විධිමත් කිරීමට කටයුතු කිරිම හා ගොඩනැගිලිවල අත්‍යාවශ්‍ය කොටස් අළුත්වැඩියා කිරිම සඳහා 2021 දෙසැම්බර් 03 දින සති 02 කින් නිම කිරීමට සමිතියක් සමඟ | දෙසැම්බර් 31 ට පෙර සභාව වෙත මුදල් ප්‍රතිපූර්ණය කර ගත යුතුව තිබු නිසා මුදල් ප්‍රතිපූර්ණයට පමණක් | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුවේ. |

රු.2,999,879 කට ගිවිසුම් ගත වී තිබුණි. 2021 ඔක්තෝබර් 27 දින සමිතිය විසින් සියයට 75 ක අත්තිකාරමක් ඉල්ලා තිබු අතර රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.4 (I) පටහැනිව 2021 දෙසැම්බර් 08 දින සියයට 70 ක අත්තිකාරමක් වූ රු.2,099,286 ක් ගෙවා තිබුණි. 2022 ජනවාරි 10 දින ස්ථානීය පරීක්ෂාවේදී ගේට්ටු කණු 02 ක් පමණක් ඉදි කර තිබූ අතර 2021 දෙසැම්බර් 03 දින ගිවිසුම්ගතව ව්‍යාපාතියේ වැඩ අවසන් කර නොතිබියදී 2021 දෙසැම්බර් 14 දින කර්මාන්තය නිසියාකාරව සම්පූර්ණ කර ඇති බවට මුදල් රෙගුලාසි 237 උපලේඛනයේ (III) ප්‍රකාර මෙම කර්මාන්තය මෙතෙක් කරන ලද වැඩ මනා තත්ත්වයෙන් කළ බවත්, ඇස්තමේන්තු හා ගිවිසුමට අනුකූලව කොන්ත්‍රාත්තුවේ නියමයන් හා කොන්දේසි නොපිරිහෙලා ඉටු කර ඇති බවත් සහතික කර රු.2,999,879 ක් සමිතිය වෙත ගෙවීමට වැඩ අධිකාරි විසින් නිර්දේශ කර තිබුණි. වැඩ අවසන් කර නොතිබු කාර්යයක් වෙනුවෙන් ව්‍යාජ ලෙස මුදල් ඉල්ලීම් කර දින රහිතව රු.2,999,879 ක ඇස්තමේන්තු මුදලට සමාන අවසන් ගෙවිම් විස්තරයක් හා මිනුම් පත්‍රයක්, ගෙවීම් වවුචරය සමඟ 2021 දෙසැම්බර් 24 දින පළාත් පාලන කොමසාරිස් වෙත යවා තිබුණි.

ආදාළ මුදල ඇතුළත් කර ප්‍රතිපූර්ණ ගෙවීම් වාර්තාවක් සකස් කර තිබුනි. ඒ අනුව මෙහි වැඩ අවසන් කිරීම පිළිබඳව සෑහීමකට පත්ව වැඩ අධිකාරී විසින් අත්සන් කර තිබු බවද දන්වමි